**සමාගම් ගිණුම් අභ්‍යාස අංක 02**

2. සී/සහිත සාරා පොදු සමාගම කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමකි. 2020.03.31 දිනට සමාගමේ ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

**සීමා සහිත සාරා පොදු සමාගමේ 2020.03.31 දිනට ශේෂ පිරික්සුම**

| විස්තරය | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 5,000 |
| 2019.03.31 දිනට රඳවාගත් ඉපයීම | | 1,200 |
| විකුණුම් පිරිවැය/විකුණුම් | 6,185 | 11,500 |
| වෙළඳ ලැබිය යුතු දෑ/වෙළෙඳ ගෙවිය යුතු දෑ | 430 | 360 |
| දේපළ පිරියත හා උපකරණ (පිරිවැයට) | | |
| ඉඩම් ගොඩනැගිලි | 3.000 | |
| මෝටර් රථ | 2,000 | |
| කාර්යල උපකරණ | 1,200 | |
| ලී බඩු සවිකිරීම | 800 | |
| මෝටර් රථ (කල්බදු ක්‍රමයට ලබාගත්) | 1,000 | |
| 2019.03.31 දිනට ක්ෂය සඳහා ප්‍රතිපාදන | | |
| ගොඩනැගිලි | | 450 |
| මෝටර් රථ | | 1,600 |
| කාර්යාල උපකරණ | | 420 |
| ලී බඩු හා සවිකිරීම | | 240 |
| භාණ්ඩාගාර බිල්පත් (දින 90) | 1,300 | |
| වෙළෙඳ තොග | 900 | |
| 10% ආයෝජන | 1,000 | |
| පරිපාලන වියදම් | 850 | |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 1,100 | |
| වෙනත් මෙහෙයුම් වියදම් | 450 | |
| 2018/2019 වර්ෂය සඳහා ආදායම් බදු වෙන්කිරීම | | 250 |
| බැංකු අයිරාව | | 600 |
| අතැති මුදල් | 3,490 | |
| 5% බැංකු ණය | | 2,000 |
| ගෙවූ ආදායම් බදු | 600 | |
| ආයෝජන ආදායම් | | 140 |
| බැංකු ණය පොළී | 80 | |
| 2019.04.01 දිනට හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම | | 55 |
| කල්බදු වාරික | 430 | |
| | **23,815** | **23,815** |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

**අතිරේක තොරතුරු**

1) 2020.03.31 දිනෙන් අවසන් වසරේ මූල්‍ය ප්‍රකාශ 2020.07.15 දින අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලදි. 2020.05.20 වන දින ව්‍යාපාරයේ 2020.03.31 දිනට ව්‍යාපාරයේ පැවති තොගය රු. 850,000 ක් විකුණන ලදි.
2) 2019.07.01 දින සමාගමේ පැවති පැරණි කාර්යාල උපකරණ කට්ටලයක් නව කාර්යාල උපකරණයක් සමඟ හුවමාරු කරන ලද අතර 2019.04.01 දිනට මෙම පැරණි උපකරණ කට්ටලයේ පොත් අගය රු. 240,000 ක් වන අතර එය 2017.04.01 දින මිලදී ගෙන ඇත. හුවමාරුවේදී රු. 168,000 ක් නව කාර්යාල උපකරණ වෙනුවෙන් මුදලින් ගෙවන ලද අතර එය නව උපකරණයේ පිරිවැයෙන් 40% ක් නියෝජනය කරයි. මේ සම්බන්ධව වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.
3) ව්‍යාපාරය පිහිටි ඉඩමේ පිරිවැය රු. 1,200,000 ක් වන අතර 2020.03.31 දින රු. 1,500,000 කට ප්‍රත්‍යාගණනය කරන ලදි.
4) සමාගමේ ක්ෂය කළ හැකි වත්කම් සරල මාර්ග ක්‍රමයට පහත ක්ෂය ප්‍රතිශතයන් යටතේ වාර්ෂිකව ක්ෂය කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| මෝටර් රථ | 20% |
| කාර්යාල උපකරණ | 10% |
| ලී බඩු හා සවිකිරීම | 20% |

5) වෙළෙඳ ලැබිය යුතු ශේෂ සම්බන්ධව පහත ගැලපීම් සිදුකළ යුතු ය.

- 2019.04.01 දිනට නිශ්චිත හානිකරණ අලාභ ලෙස වෙන්කර තිබූ රු. 30,000 ක ශේෂයක් ස්ථිරව නොලැබෙන වට අනාවරණය වී ඇත.
- 2020.03.31 දිනට වෙළඳ ලැබිය යුතු ශේෂ මත 5% හානිකරණ අලාභ ඉඩහැරීමක් කළ යුතුය.

6) 2019.04.01 දින සමාගම කල්බදු ගිවිසුමකට එළඹුනු අතර වසර 4ක කාලයක් සඳහා මෝටර් රථයේ භාවිත අයිතිය ලබා ගන්නා ලදි. 2019.04.01 දිනට මෝටර් රථයේ භාවිත අයිතිය පිරිවැය සහ ඵලදායී ජීව කාලය පිළවෙළින් රු. 1,000,000 ක් සහ වසර 5ක් ලෙස ඇස්තමේන්තු කරන ලදි. 2019.04.01 දින මූලික ගෙවීම ලෙස රු. 200,000 ක් ගෙවූ අතර 2020.03.31 දින ප්‍රථම වාර්ෂික වාරිකය ලෙස රු. 230,000 ක් ගෙවන ලදි. මූලික මිනුම් කිරිමේදී කල්බදු වගකීම රු. 800,000 ක් විය. 2020.03.31 සහ 2021.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා කල්බදු පොළිය පිළිවෙළින් රු. 30,000 ක් හා රු. 25,000 ක් වේ. සමාගම විසින් ගෙවන ලද මූලික ගෙවීම සහ ප්‍රථම කල්බදු වාරිකය පමණක් කල්බදු වාරික ගිණුමේ සටහන් කර තිබුණි. මේ සම්බන්ධව වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.
7) සමාගම විසින් සිදුකරනු ලබන විකුණුම් වටිනාකම් මත 2% ක් වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය කළ යුතු ය.
8) 2020.03.31 දින ඇතිකරගත් රු. 700,000 ක විකුණුම් ගිවිසුමක් සඳහා රු. 500,000 ක මුදලක් අත්තිකාරම් ලෙස ලැබුණු අතර එය විකුණුම් ලෙස ගිණුම්ගත කර තිබුණි.
9) 2020.03.31 දිනට පහත උපචිත වියදම් සඳහා ගැලපීම් සිදුකළ යුතු ය.

| | | |
|---|---|---|
| බෙදාහැරීමේ වියදම් | - | රු. 50,000 |
| කාර්යාල පිරිසිදු කිරීම් | - | රු. 10,000 |

10) සමාගමේ සේවකයෙකු විසින් රු. 60,000 ක වන්දියක් ඉල්ලා නඩුවක් පවරා ඇත. එය තවමත් විභාගවෙමින් පවතී.
11) වසර තුළ ගෙවූ ආදායම් බදු වල පෙර වර්ෂයට අදාළව ගෙවූ රු. 300,000 ක් ඇතුළත් වේ. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු. 750,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

12) අධ්‍යක්ෂකවරුන් විසින් පහත යෝජනා සම්මත කරගෙන ඇත.

සාමාන්‍ය කොටස් සඳහා රු. 100,000 ක ලාභාංශයක් ගෙවීම.

රු. 400,000 ක රඳවාගත් ඉපයුම් යොදාගෙන පොදු සංචිතයක් ඇතිකිරීම.

**<u>අවශ්‍ය වන්නේ,</u>**

1) 2020.03.31 න් අවසන් වසරේ සමාගමේ ලාභ හෝ අලාභ හා අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය (සටහන් ද ඇතුළුව)
2) 2020.03.31 න් අවසන් වසරේ හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය
3) 2020.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

## පිළිතුරු

අභ්‍යාස 02

**සී/ස සාරා පොදු සමාගමේ2020.03.31 අවසන් වර්ෂයේ ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය**

| විස්තරය | | රු. '000 | රු. '000 |
|---|---|---|---|
| විකුණුම් | | | 11,000.00 |
| විකුණුම් පිරිවැය | | | 6,185.00 |
| දළ ලාභය | | | 4,815.00 |
| වෙනත් ආදායම් | (1) | | 119.50 |
| | | | **4,934.50** |
| බෙදාහැරීමේ වියදම් | | 1,965 | |
| පරිපාලන වියදම් | | 1,239 | |
| වෙනත් වියදම් | | 500 | |
| මූල්‍ය වියදම් | | 130 | (3,834) |
| බදු පෙර ලාභය | (2) | | 1,100.50 |
| (-) ආදායම් බදු | (3) | | (750.00) |
| කාලච්ඡේදයේ ලාභය | | | **350.50** |
| වෙනත් විස්තීරණ ආදායම් | | | |
| ඉඩම් ප්‍රත්‍යාගණන ලාභ | | | 300 |
| මුළු විස්තීරණ ආදායම | | | **650.50** |

**සී/ස සාරා පොදු සමාගමේ2020.03.31 අවසන් වර්ෂයේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | සා.කොටස් | ප්‍රත්‍යාගණන සංචිත | පොදු සංචිත | රඳවාගත් ලාභය | එකතුව |
|---|---|---|---|---|---|
| 2019.04.01 ශේෂය | 5,000 | - | - | 1,200 | 6,200 |
| මුළු විස්තීරණ ආදායම් | - | 300 | - | 350.5 | 650.5 |
| පොදු සංචිතයට මාරු කිරීම | - | - | 400 | (400) | |
| 2020.03.31 දිනට ශේෂය | 5,000 | 300 | 400 | 1,150.5 | 6,830.5 |

අන්තර්ගතය : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
සැකසුම : ඩී.එම්. චන්දන කුමාර දිසානායක, පු/ආණ/ශ්‍රී රතනපාල ම.වි. - මහඋස්වැව.
Copyright © www.e-thaksalawa.moe.gov.lk

### සී/ස සාරා පොදු සමාගමේ 2020.03.31 අවසන් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| **ජංගම නොවන වත්කම්** | **සටහන්** | | **(රු. '000)** |
|---|---|---|---|
| දේපළ පිරියත උපකරණ | 4 | | 3,998.50 |
| භාවිත අයිතිය ඇති වත්කම් | 5 | | 800.00 |
| 10% ආයෝජන | | | 1,000.00 |
| | | | 5,798.50 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 850 | |
| වෙළඳ ලැබිය යුතු ද | | 380 | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 6 | 4,622 | 5,852.00 |
| මුළු වත්කම් | | | 11,650.50 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 5000 | |
| ප්‍රත්‍යාගණන සංචිත | | 300 | |
| පොදු සංචිතය | | 400 | |
| රඳවාගත් ඉපයීම් | | 1,150.50 | 6,850.50 |
| **ජංගම නොවන වගකීම** | | | |
| කල්බදු වගකීම | | 395 | |
| බැංකු ණය | | 2000 | 2,395 |
| **ජංගම වගකීම්** | | | |
| කල්බදු වගකිම | | 205 | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 360 | |
| වෙනත් ගෙවිය යුතු දෑ | 7 | 840 | |
| උපචිත ආදායම් බදු | | 400 | |
| බැංකු අයිරාව | | 600 | 2,405 |
| | | | 11,650.50 |

5) **භාවිත අයිතිය සහිත වත්කම්** රු. '000

| | |
|---|---|
| මූලික මිනුම් කිරිමේදී පිරිවැය | 1,000 |
| සමුච්චිත ක්ෂය | (200) |
| 2020.03.31 දිනට ධාරණ අගය | **800** |

6) **මුදල් හා මුදල් සමාන දෑ** රු. '000

| | |
|---|---|
| අතැති මුදල් (3490 - 168) | 3322 |
| දින 90 භාණ්ඩාගාර බිල්පත් | 1300 |
| | **4622** |

අන්තර්ගතය : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
සැකසුම : ඩී.එම්. චන්දන කුමාර දිසානායක, පු/ආණ/ශ්‍රී රතනපාල ම.වි. - මහඋස්වැව.
Copyright © www.e-thaksalawa.moe.gov.lk

7) **වෙනත් ගෙවිය යුතු දෑ හා ප්‍රතිපාදන** රු.'000

| | |
|---|---|
| වගකීම් සහතික | 220 |
| උපචිත බෙදාහැරීම් වියදම් | 50 |
| උපචිත කාර්යාල පිරිසිදු කිරීම් | 10 |
| ඉදිරියට ලද ආයෝජන ආදායම් | 40 |
| උපචිත බැංකු ණය පොළී | 20 |
| විකුණුම් අත්තිකාරම් | 500 |
| | **840** |

8) සේවකයෙකු විසින් රු. 60,000 ක වන්දි මුදලක් ඉල්ලා නඩුවක් පවරා ඇත.

9) අධ්‍යක්ෂකවරු විසින් සාමාන්‍ය කොටස් සඳහා රු. 100,000 ක ලාභාංශයක් යෝජනා කර ඇත.

<u>පෙර වැඩ</u>

| | **බෙදාහැරීමේ** | **පරිපාලන** | **වෙනත්** | **මූල්‍ය** |
|---|---|---|---|---|
| කෙටුම්පත් ශේෂ | 1,100 | 850 | 450 | |
| තොග අලාභ | | | 50 | |
| ගොඩනැගිලි ක්ෂය | | 90 | | |
| මෝටර් රථ ක්ෂය | 400 | | | |
| කාර්යාල උපකරණ ක්‍ෂය | | 129 | | |
| ලී බඩු ක්ෂය | | 160 | | |
| අධි අඩමාණ ණය | (5) | | | |
| කල්බදු පොළී | | | | 30 |
| වගකීම් සහතික | 220 | | | |
| බෙදාහැරීමේ වියදම් | 50 | | | |
| කාර්යාල පිරිසිදු කිරීම | | 10 | | |
| බැංකු ණය පොළී | | | | 100 |
| | **1,965** | **1,239** | **500** | **130** |


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සටහන්

**සටහන 01** (රු. '000)

වෙනත් ආදායම්

| | |
|---|---|
| උපකරණ විකුණුම් ලාභ | 19.5 |
| ආයෝජන ආදායම | 100 |
| | 119.5 |

**සටහන 02**

බදු පෙර ලාභය ගණනය කර ඇත්තේ පහත වියදම්ද අඩු කරය.

| | |
|---|---|
| තොග අලාභ | 50 |
| දේපළ පිරියත හා උපකරණ ක්ෂය | 779 |
| කල්බදු පොළී | 30 |
| බැංකු ණය පොළී | 100 |
| වගකීම් සහතික | 220 |
| භාවිත අයිතිය සහිත මෝටර් රථ ක්ෂය | 200 |

**සටහන 03**

ආදායම් බදු

| | |
|---|---|
| ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බදු | 700 |
| (+) ඌණ ආදායම් බදු | 50 |
| | 750 |

4) දේපළ පිරියත උපකරණ

| පිරිවැය | ඉඩම් | ගොඩනැගිලි | මෝටර් රථ | යන්ත්‍ර පිරියත | කාර්යාල උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2019.04.01 දිනට ශේෂය | 1,200 | 1,800 | 2,000 | 1,200 | 800 | 7,000 |
| මිලදී ගැනීම | | | | 420 | | 420 |
| ඉවත් කිරීම් | | | | (300) | | (300) |
| ප්‍රත්‍යාගණන අලාභ | 300 | | | | | |
| 2020.03.31 ට ශේෂය | **1,500** | **1,800** | **2,000** | **1,320** | **800** | **7,420** |
| සමුච්චිත ක්ෂය | | | | | | |
| 2019.04.01 දිනට ශේෂය | | 450 | 1,600 | 420 | 240 | 2,710 |
| වර්ෂයට අදාළ ක්ෂය | | 90 | 400 | 129 | 160 | 779 |
| ඉවත්කිරීම් | | | | (67.5) | - | (67.5) |
| 2020.03.31 ට ශේෂය | | 540 | 2,000 | 481.5 | 400 | 3,421.5 |
| 2020.03.31 ට ධාරණ අගය | **1,500** | **1,260** | **-** | **8,385** | **400** | **3,998.5** |


Copyright © www.e-thaksalawa.moe.gov.lk

වාසනා පොදු සමාගම 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| ජංගම නොවන වත්කම් | සටහන් | | (රු. '000) |
|---|---|---|---|
| දේපළ පිරියත උපකරණ | 4 | | 11,228.75 |
| භාවිත අයිතිය ඇති වත්කම් | 5 | | 695.28 |
| ආයෝජන | | | 1,000 |
| | | | 12,924.03 |
| ජංගම වත්කම් | | | |
| තොගය | | 290 | |
| වෙළඳ ලැබිය යුතු දෑ (570-57) | | 513 | |
| වෙනත් ලැබිය යුතු දෑ | | 50 | 853 |
| මුළු වත්කම් | | | 13,777.03 |
| හිමිකම් හා වගකීම් | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සා.කො) | | 5050 | |
| පොදු සංචිත | | 800 | |
| රඳවාගත් ලාභ | | 4,304.28 | 10,154.286 |
| ජංගම නොවන වගකීම | | | |
| දිගුකාලීන වගකීම් | | 277.518 | |
| 12% ණයකර | | 1000 | 1,277.818 |
| ජංගම වගකීම් | | | |
| උපචිත ආදායම් බදු | | 150 | |
| කල්බදු වගකිම | | 120.226 | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 100 | |
| බැංකු | | 975 | |
| වෙනත් ගෙවිය යුතු දෑ | | 1000 | 2,315.226 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 13,377.03 |


Copyright © www.e-thaksalawa.moe.gov.lk